# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,921 — 1970 අගෝස්තු 28 වැනි සිකුරාද — 1970.8.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 591 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | 596 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 593 | දේපල විකිණීම ... ... ... | — |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | 595 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... ... | 598 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී 39/52

### ගම්සභා ආඥාපනත

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති, පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු උතුර ගම්සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

පීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970.8.10 දින,
කොළඹ දී ය.

8-1044—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.බී. 69/41.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ගාලු දිස්ත්‍රික්කයේ බටපොල ගම්සභා ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට ඒ ගම්සභාවට මේ නිවේදනය මගින් බලය පවරමි.

පීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970.8.17 දින,
කොළඹ දී ය.

8-1051—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල්.ඞී.—බී.139/46.

## විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ නෙළුව ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරනු ලැබ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද පහත සඳහන් යෝජනාව, ඒ වගන්තියේ (2) වන උප වගන්තිය අනුව පළකරනු ලැබේ.

### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මේ සභාව විසින් එහි පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කොට ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගාස්තුවලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට, මෙයින් පනවා අයකරනු ලැබේ.

| ගෙවන මුදල | බදු ප්‍රමාණය |
|---|---|
| බදු ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තු :— | රු. ශ. |
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 0 05 |
| (ආ) ශත 50 ට වැඩි වන නමුත් රු. 1 ට වැඩි නොවන විට | 0 10 |
| (ඇ) රු. 1 ට වැඩි නමුත් රු. 1.50 ට වැඩි නොවන විට | 0 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි නමුත් රු. 2 ට වැඩි නොවන විට | 0 20 |
| (ඉ) රු. 2 ට වැඩි නමුත් රු. 3 ට වැඩි නොවන විට ... | 0 30 |
| (ඊ) රු. 3 ට වැඩි නමුත් රු. 4 ට වැඩි නොවන විට ... | 0 40 |
| (උ) රු. 4 ට වැඩි නමුත් රු. 5 ට වැඩි නොවන විට ... | 0 50 |
| (ඌ) රු. 5 ට වැඩි නමුත් රු. 10 ට වැඩි නොවන විට ... | 1 0 |
| (එ) රු. 10 ට වැඩි වන විට එසේ වැඩි වන එක් එක් අතිරේක රු. 5 හෝ ඉන් කොටසකින් සියයට 10 ක් | |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.8.17 වැනි දින,
කොළඹ දීය.

8–1050—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—බී. 139/46

## විනෝද බදු ආඥාපනත

### මොරගොල්ලාගම ගම්සභාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොරගොල්ලාගම ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙහි පළකරනු ලැබේ.

### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මේ ගම්සභාව විසින් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ගම්සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ නිශ්චිත පරිදි) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක් පනවා අයකරනු ලැබේ.

#### අයකරනු ලබන මුදල් ප්‍රමාණය

| බද්ද හැර ඇතුලුවීමේ ගාස්තුව | රු. ශ. |
|---|---|
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නො වන විට ... ... | 0 05 |
| (ආ) ශත 50 ට වැඩි නමුත් රු. 1 ට වැඩි නොවන විට ... | 0 10 |
| (ඇ) රු. 1 ට වැඩි නමුත්, රු. 1.50 ට වැඩි නොවන විට ... | 0 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි නමුත් රු. 2 වැඩි නොවන විට ... | 0 20 |
| (ඉ) රු. 2 ට වැඩි නමුත් රු. 3 ට වැඩි නොවන විට ... | 0 30 |
| (ඊ) රු. 3 ට වැඩි නමුත් රු. 4 ට වැඩි නොවන විට ... | 0 40 |
| (උ) රු. 4 ට වැඩි නමුත් රු. 5 ට වැඩි නොවන විට ... | 0 50 |
| (ඌ) රු. 5 ට වැඩි නමුත් රු. 10 වැඩි නොවන විට ... | 1 00 |
| (ඒ) රු. 10 ට වැඩි වන විට : | |
| (1) පළමු රු. 10 ට ... ... | 1 00 |
| (2) එක් එක් අතිරේක රු. 5 ට හෝ ඉන් කොටසකට ... ... | 1 00 |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්.

කොළඹ,
1970.8.12 දින.

8–1045—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 (5) වගන්තිය යටතේ වූ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වෙනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ගන්හේවගේ දයානන්ද ද සිල්වා, වන මා විසින් අඹන්පොල ගම්සභාවට සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා රැස්වීමක් 1970 සැප්තැම්බර් මස 6 වෙනි දින පෙරවරු 11 ට අඹන්පොල පිහිටි අඹන්පොල ගම්සභා කාර්යාලයේ දී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ග. දයානන්ද ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල.

1970 අගෝස්තු මස 17 වෙනි දින,
කුරුණෑගල පළාත් පාලන කාර්යාලයේ දීය.

8–1046—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 (5) වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත, ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ජයනාදිපතිගේ ගුණපාල කීර්තිරත්න වන මා විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර ගම්දොලහපත්තු ගම්සභාවට සභාපතිකුමකු තෝරා පත්කර ගැනීම සඳහා රැස්වීමක් 1970 සැප්තැම්බර් මස 3 වැනි දින පෙ. ව. 10 ට දේවාලේගම, ඉඹුල්ගස්දෙනියේ පිහිටි ඕතර ගම්දොලහපත්තු ගම්සභා කාර්යාලයේ දී මෙයින් කැඳවනු ලැබේ.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල දිස්ත්‍රික්කය.

පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලය,
කෑගල්ල, 1970.8.18 දින.

8–1039—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

(iii) පහත සඳහන් ලියවිලි අවශ්‍ය වෙනවා ඇත :—

(ඒ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්. (පාඨශාලාවට ඇතුළුවීම සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ).

(බී) පළාත් පාලන සේවා කොමිෂන් සභාවට ඒත්තු ගත හැකි වන යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්; අයදුම්කරු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක අධ්‍යාපනය ලැබූවෙක් නම්, ඔහු අන්තිම වරට ඉගෙනුම ලැබූ රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙන් ලැබූ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ නොමැති නම්, කැමති පරිදි අයදුම්කරුගේ ගුරුවරයාගෙන් හෝ පාඨශාලාචාර්ය වරයාගෙන් හෝ ප්‍රසිද්ධ නිලධාරියකුගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයෙකුගෙන් හෝ අධිනීතිඥයෙකුගෙන් හෝ නීතිඥයෙකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුගෙන් හෝ සාමාන්‍ය වශයෙන් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය හැකි ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙන් ලබාගත් චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

(සී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත්‍ර.

(ඩී) හඳුනා ගැනීමේ පත්‍රය.

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියළුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ගෙන්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටි විටෙක ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වන අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ඇතුළත්වීම අවලංගු කරනවා ඇත.

සැ. යු.—(ඒ) නියමිත ආකෘති පත්‍රයේ නොලියන ලද අයදුම්පත්‍ර භාරගනු නොලැබේ.

(බී) මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත්කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත්කරනු ලැබේ.

(ii) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් තමන්ට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) විභාගය පැවැත්වෙන දිනට යටත් පිරිසෙයින් දින 7 කටවත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම්දිය යුතුයි. ඇතුළත් වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම්දෙන අතරම, පහත සඳහන් තොරතුරු සැපයිය යුතුයි :—

(ඒ) විභාගයේ නම :————.

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(සී) සම්පූර්ණ ලිපිනය :————.

සැ. යු.—විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සලකනු නොලැබේ.

10. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇගේ ඇතුළත් වීම අවලංගු කරන්නට පිළිවන.

11. අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් ඉදිරිපත් කරන යම් කිසි තොරතුරක් ඔවුන් දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත්, සේවයෙන් පහකරන්නට පිළිවන. සිත්‍ මතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණහොත්, ඒ සමානම දඬුවම් ලැබීමට පිළිවන.

12. **මුදල් ආපසු දීම.**—කවර කරුණක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු දෙනු නොලැබේ.

13. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ ප්‍රාදේශිය බලමණ්ඩලවල සේවය කරන පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

14. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්.

(බී) මේ විභාගයේ දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළතදී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

15. **විභාග පරිපාටිය.**—පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයයක් වෙනුවෙන් නියමිත ලකුණුත්ය. අශෝභන අත් අකුරු ගැන හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැනද ලියලුම් ලිඛිත උත්තර පත්‍ර වලින් ලකුණු අඩුකරනු ලැබේ. නොපැහැදිලි අකුරු ලියන ලද විභාග අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත්වීමට ඉඩ තිබේ.

| | | |
|---|---|---|
| | | ලකුණු |
| **1 වැනි පත්‍රය :**—සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම— | | |
| | (i) සාහිත්‍ය පාඨයක්, | |
| | (ii) සාමාන්‍ය පාඨයක්, | |
| | (iii) (අ) කාර්යාලයීය ලිපියකින් හෝ වාර්තාවකින් සහ | |
| | (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් උපුටා ගත් කොටසක් (පැය 3 යි) ... | 100 |
| **2. වැනි පත්‍රය :**—ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම— | | |
| | (i) සාහිත්‍ය පාඨයක්, | |
| | (ii) සාමාන්‍ය පාඨයක්, | |
| | (iii) (අ) කාර්යාලයීය ලිපියකින් හෝ වාර්තාවකින් | |
| | (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් උපුටා ගත් කොටසක් (පැය 3 යි) ... | 100 |

16. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම් හා පත්වීම් දීම.**—සමත්වන අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ප්‍රසිද්ධ කරනු ඇත. පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ඇත.

17. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගත් අපේක්ෂකයන් ලංකාවේ කවර පළාතක හෝ සේවය කිරීමට ශාරීරික වශයෙන් යෝග්‍ය බව ඔප්පු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ.

සැ. යු.—විභාගය පිළිබඳ කිසිම ලිපියක් ලේකම් තැනගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

* පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන වචනයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන්ය.

විභාග අංකය :————.
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

## පළාත් පාලන භාෂා පරිවර්තකයින්ගේ සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සිංහල විභාගය—1970.10.21 දින

**ඇතුළත් වීමේ අයදුම් පත්‍රය**

1. (ඒ) ඔබේ පුරුදු අත්සන :————.
   මූලකුරු සමඟ ඔබේ නම :————.
   නම් සියල්ල (සම්පූර්ණයෙන් පැහැදිලි ලොකු අකුරින්)
   මහතාද/මහත්මියද/මෙනවියද යන වග සඳහන් කරන්න :
   ————.
   (බී) සම්පූර්ණ ලිපිනය (වෙනස් වූ වහාම දැන්විය යුතුයි.) :
   ————.

2. (ඒ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—
   (i) පරම්පරාවෙන් ද :————.
   නැතහොත්
   (ii) ලියා පදිංචි වීමෙන් ද :————.
   (බී) උපන් ස්ථානය—
   (i) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ :————.
   (ii) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ පියාගේ :
   ————.
   (iii) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ පිය පක්ෂයේ මුත්තාගේ :————.

3. (ඒ) ඔබේ උපන් දිනය :— දිනය :————, මාසය :———— වර්ෂය :————.
   (බී) 1970.9.16 වැනි දිනට ඔබේ වයස වර්ෂ වලින් හා මාස වලින් :—වර්ෂ :————, මාස :————.

4. විභාගයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීම සඳහා සමත් වී ඇති විභාගය පිළිබඳ විස්තර :—
   ප්‍රධාන :————.
   අතිරේක :————.
   (ඒ) විභාගවල නම් සහ දිනයන් :————.
   (ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදය බලන්න.)
   (බී) මධ්‍යස්ථානය :————.
   (සී) විභාග අංක :————.
   (ඩී) විෂයයන් හා එම විෂයයන් සමත් වූ ශ්‍රේණිය :
   ————.

5. ගැසට් නිවේදනයේ 5 (iv) ඡේදයේ සඳහන් සේවා මුක්ත අයට දෙනු ලබන අනුග්‍රහයන් යටතේ, විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන්නේ නම්, පහත සඳහන් විස්තර සපයන්න :—
   (ඒ) සේනාංකයේ සහ නිලයේ පදවි නාමය :————.
   (බී) ක්‍රියාත්මක සේවා කාලය :————.
   (සී) සේවයෙන් අස් කළ දිනය :————.

6. ගැසට් නිවේදනයේ 6 (i) හෝ (ii) වැනි ඡේදය යටතේ දැක්වෙන විශේෂ අනුග්‍රහයන් යටතේ විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන්නේ නම් පහත සඳහන් විස්තර සපයන්න :—
   (ඒ) ඔබ පළාත් පාලන සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්—
   (i) දැනට දරණ තනතුර :————.
   (ii) එයට පත් වූ දිනය :————.
   (බී) ඔබ ප්‍රදේශීය බලමණ්ඩලයක තාවකාලික තනතුරක් දරන්නේ නම්—
   (i) දැනට දරණ තනතුර :————.
   (ii) එයට පත් වූ දිනය :————.
   (iii) 1969.8.4 දිනට ඔබේ වයස :————.

7. මීට ප්‍රථම රක්ෂාවක් කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර—
   (ඒ) ආයතනයේ/ස්වාමියාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.
   (බී) දැරූ තනතුර :————.
   (සී) සේවය කළ කාලය :————.
   (ඩී) සේවය නතර කිරීමට හේතුව :————.

8. කිසිම වරදකට ඔබ කවදා හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ ඒ වගත්, දිනය, වරදේ ස්වභාවය, උසාවියේ නම හා නඩු නොම්මරයත් සඳහන් කරන්න :————.

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් සහතික කරමි. තවද, මම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමට බැඳෙමි. එසේ ම මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව නුසුදුස්සෙක් බව පෙනී ගියහොත්, මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැළකීමට ඉඩ ඇති බවත් මම දනිමි.

අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් අවශ්‍ය මුද්දර (රු. 25 යි) මෙහි අලවා, ඒ මත දිනයද යොදා අත්සන් කළ යුතුයි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

1970————මස————වැනි දින.

**සැ. යු.**—රජයේ/පළාත් පාලන සේවයේ ස්ථිර හෝ තාවකාලික හෝ තනතුරු දරණ අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ යුත්තේ තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා ඉදිරිපිටයි. අනිකුත් අපේක්ෂකයින් අත්සන් කළ යුත්තේ සමාදාන විනිශ්චයකාරයෙකු හෝ ආදායම් පාලන නිලධාරියෙකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හෝ වර්ෂයකට රු. 2,400ක් හෝ ඊට ඉහළ වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරියෙකු හෝ යුද්ධ හමුදාවේ හෝ නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ හෝ අධිකාරි ලත් නිලධාරියෙකු ඉදිරිපිටයි.

**අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම අයදුම්පත යම්කිසි තැනැත්තකු ඉදිරිපිටදී අත්සන් කරයිද, ඒ තැනැත්තාගේ සහතිකය**

........................පදිංචිකරුවකු වන,........................ මහතා/මහත්මිය/මෙනවිය මා පුද්ගලිකව හඳුනන බවත්, 1970 ............ මස.................වැනි දින ඔහු/ඇ මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

නම, පදවි නාමය හා තරාතිරම :————.
ලිපිනය :————.

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය**

මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ /දෙපාර්තමේන්තුවේ 19............ මස ......... වැනි දින සිට......... ........................විශයෙන් ස්ථිර/තාවකාලික සේවයෙහි යෙදී සිටින බවද, ඔහුගේ/ඇයේ සේවය සෑම විටම සතුටුදායකව පැවති බවද සහතික කරමි.

————,
ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
පදවිය :————.
දිනය :————.

8–997—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

එල්.ඩී—බී. 16/65.

## නිවේදනය

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 සහ 272 වැනි වගන්ති ප්‍රකාර මාතලේ මහ නගර සභාව විසින් පනවනු ලැබ 1969.10.31 දින අංක 14,878 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ පොදු වෙළඳපොළ පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවල සිංහල අනුවාදයේ 17 (අ) ඡේදයේ "පුද්ගලික වෙළඳ පොළක් වශයෙන්" යන වචනවලට ඉක්බිතිවම "සභාවෙන් ලැබගත් බලපත්‍රයක් නොදරන" යන වචන අන්තර්ගත කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි 28 වැනි දින,
කොළඹ දී ය.

8–1055—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## බෙන්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රය—අංක (2)

### 1970 අය–වැය ලේඛනය

1970 වර්ෂයේ අය-වැය ලේඛනයේ වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතුරු වේයයි ගණන් බලන ලද පහත සඳහන් වැය ශීර්ෂ යටතේ ඇති මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 ජූලි මස 26 වෙනි දින පවත්වන්ට යෙදුන සාමාන්‍ය මාසික සභා රැස්වීමේදී අංක 4 දරන යෝජනාවෙන් සභා සම්මත කරගන්නා ලදී.

**මුදල් ඉතිරි වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඩී.—(2) කැළි කසල : | | |
| (ඒ) වේතන ... ... ... | 2,565 | 0 |
| | 2,565 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) පොදු වියදම් : | | |
| (සී) ආදායම් පරීක්ෂක ... ... ... | 275 | 0 |
| ඒ.—(2) සංස්ථා වියදම් : | | |
| (කේ) කාර්යාල භාණ්ඩ හා උපකරණ ... ... | 425 | 0 |
| බී.—මංමාවත් : | | |
| (1) වැටුප් හා කුළී— | | |
| (සී) කුළීකරුවෝ ... ... ... | 1,155 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි— | | |
| (1) වැටුප් ... ... ... | 710 | 0 |
| | 2,565 | 0 |

1970 ජූලි මස 28 වැනි දින,
බෙන්තොට, සුළු නගර සභා කාර්යාලයේ දීය.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

අනුමත කරමි.

පර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.

1970 අගෝස්තු මස 18 වැනි දින,
ගාල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

8–1048—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

## දන්කොටුව සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) යටතේ වූ අයදුම්පත (1)

### 1970 අය–වැය ලේඛනය

1970 අය-වැය ලේඛනයෙන් පහත සඳහන් වැය ශීර්ෂ සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට අවශ්‍යවී ඇති අතිරේක වැය සඳහා ඒ ඒ ශීර්ෂයන් යටතේ යෙදීමට 1970 ජූලි මස 28 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 3 (I) දරන යෝජනාවෙන් සභා සම්මත විය.

**I කොටස**

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ.—1 (ජී) | විවාහක දීමනා ... ... | 1,000 | 0 |
| ඒ.—2 (ඒ) | දීමනා ... ... ... | 500 | 0 |
| ඒ.—2 (ජී) | වාහන කහඩු ... ... | 63 | 0 |
| ඒ.—2 (අයි) | නිවාඩු දුම්රිය ප්‍රවේශ ... ... | 250 | 0 |
| ඒ.—2 (කේ) | කාර්යාල උපකරණ ... ... | 800 | 0 |
| බී.—1 (සී) | කම්කරු කුළී ... ... | 300 | 0 |
| බී.—10 | සෙවන ගස් ... ... ... | 1,000 | 0 |
| බී.—13 | විවාහකදීමනා ... ... | 125 | 0 |
| ඩී.—1 (සී) | දීමනා ... ... ... | 70 | 0 |
| ඩී.—1 (ජේ) | සෞඛ්‍ය සති දීමනාව ... ... | 50 | 0 |
| ඩී.—1 (ඔ) | විවාහක දීමනාව ... ... | 30 | 0 |
| ඩී.—5 (එච්) | ප්‍රසිඩ නානා ස්ථාන ... ... | 3,500 | 0 |
| ඩී.—7 (බී) | වෙළඳපල නඩත්තුව ... ... | 90 | 0 |
| ඊ.—1 | කුළී ... ... ... | 600 | 0 |
| ජේ.—2 | වැටුප් ... ... ... | 30 | 0 |
| ජේ.—3 | පොත්පත් සහරා ... ... | 456 | 0 |
| | | 8,864 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ.—1 (ඒ) | ලේකම් වැටුප් ... ... | 600 | 0 |
| ඒ.—1 (බී) | ලිපිකරු වැටුප් ... ... | 1,900 | 0 |
| ඒ.—1 (ඩී) | කා.කා.ස. වැටුප් ... ... | 715 | 0 |
| ඒ.—2 (ඇෆ්) | ලිපි ද්‍රව්‍ය ... ... ... | 500 | 0 |
| බී.—1 (බී) | ඕවර්සියර් වැටුප් ... ... | 685 | 0 |
| ඩී.—1 (බී) | සෞ. ක. වැටුප් ... ... | 360 | 0 |
| ඩී.—2 (ඒ) | කුළී ... ... ... | 650 | 0 |
| ඩී.—2 (බී) | කරත්ත හා ගොන් ... ... | 1,000 | 0 |
| ඩී.—3 (ඒ) | කුළී ... ... ... | 525 | 0 |
| ඩී.—3 (බී) | කරත්ත ... ... ... | 225 | 0 |
| ඩී.—3 (ඊ) | වැසිකිළි නඩත්තුව ... ... | 1,000 | 0 |
| ඩී.—4 (ඒ) | කුළී ... ... ... | 354 | 0 |
| ඩී.—7 (ඒ) | කුළී ... ... ... | 350 | 0 |
| | | 8,864 | 0 |

II වැනි කොටස

| ඉතිරි මුදල් වැය ශීර්ෂ | රු. | ශ. | වැඩිපුර වියදම් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| විදුලිය 10—ව්වාහක දීමනා ... ... | 1,275 | 0 | විදුලිය 4 (ඒ) පරිපාලන වේතන ... ... | 1,275 | 0 |
| | 1,275 | 0 | | 1,275 | 0 |

1970 ජූලි මස 29 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

වී. පී. ප්‍රනාන්දුපුල්ලේ,
දන්කොටුව සුළු නගර සභාවේ වැඩ බලන සභාපති.

අනුමත කරමි.

1970 අගෝස්තු මස 17 වැනි දින,
හලාවත දී ය.

ඇල්. ජී. ටී. වික්‍රමසේකර,
හලාවත-පුත්තලම සහකාර පළාත් පාලන කොමසාරිස්.

## දන්කොටුව සුළු නගර සභාව

### 1 වැනි පරිපූරක අය-වැය ලේඛනය

I කොටස

| වැය ශීර්ෂය | | රු. | ශ. |
|---|---|---|---|
| බී.—7 | සතුකර ගැනීම් ... | 15,000 | 0 |
| ඩී.—3 (ඩී) | වැසිකිළි ඉදිකිරීම ... | 750 | 0 |
| ඩී.—4 (ඩී) | මස්මඩුව ඉදිකිරීම ... | 250 | 0 |
| | | 16,000 | 0 |

II කොටස

| | රු. | ශ. |
|---|---|---|
| විදුලිය 4 (ඒ) පරිපාලන වේතන ... | 300 | 0 |
| | 300 | 0 |

1970.7.23 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 3 (2) දරන යෝජනාවෙන් පිළිගෙන සම්මත කරන ලදී.

1970 ජූලි මස 28 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

වී. පී. ප්‍රනාන්දුපුල්ලේ,
දන්කොටුව සුළු නගර සභාවේ වැඩබලන සභාපති.

අනුමත කරමි.

1970 අගෝස්තු මස 17 වැනි දින,
හලාවත දී ය.

ඇල්. ජී. ටී. වික්‍රමසේකර,
හලාවත-පුත්තලම සහකාර පළාත් පාලන කොමසාරිස් තැන.

8-1042/1—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### I වැනි පරිපූරක අය-වැය ලේඛනය-1970

සාමාන්‍ය

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.—(1) (ඇ/ජ) විශ්‍රාම වැටුප් ... ... | 136 | 0 |
| ඊ.—(4) ආධාර හා දීමනා ... ... | 150 | 0 |
| අයි.—(1) ගිනි නිවන උපකරණ හා නැවත පිරවීම් ආදියෙහි වියදම් ... ... ... | 200 | 0 |
| | 486 | 0 |

විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී.—(2) (ඩී) විදුලි බලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම ... ... ... ... | 1,000 | 0 |
| ඊඩී.—(3) (ඒ) උපකරණ (නව සේවා හා නිවාස සම්බන්ධතාවෝ) ... ... ... | 1,500 | 0 |
| | 2,500 | 0 |

1970 ජූලි මස 12 වැනි දින පැවැත්වූ වෙන්නප්පුව සුළු නගර සභාවේ විශේෂ සභා රැස්වීමේදී අංක 2 දරන යෝජනාවෙන් සභා සම්මත විය.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
වෙන්නප්පුව, 1970 අගෝස්තු මස 10 වැනි දින.

අනුමත කරමි.

එල්. ජී. ටී. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම් කොට්ඨාශය.

1970 අගෝස්තු මස 17 වැනි දින,
හලාවත, පළාත් පාලන කාර්‍යාලයේ දීය.

8-1042/2—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල දිස්ත්‍රික්කයේ—අරණායක ගම්සභාව

### ගම්සභා ආඥපනත—257 වැනි පරිච්ඡේදය

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ගම්සභාව විසින් පහත සඳහන් යෝජනාව 1970 ජූලි මස 30 වැනි දින පවත්වන ලද ගම්සභා රැස්වීමේදී සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඒ. පී. ගුණරත්න,
අරණායක ගම්සභාවේ සභාපති.

1970 ක්වූ අගෝස්තු මස 18 දින,
අරණායක, ගම්සභා කාර්යාලයේදීය.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ගම්සභාව විසින් 1965 අගෝස්තු මස 20 වැනි දින අංක 14,486 දරණ ගැසට්පත්‍රයේ පලකරණ ලද යෝජනාවෙන් සම්මතකර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකි නෙක ඉදිරියෙන් සඳහන් දිග පළල අනුව සාද හෝ නැවතසාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරණු ලැබේ.

| අංකය | කොට්ඨාශය | පාවේ නම | දිග දම්වැල් | පලළ අඩි |
|---|---|---|---|---|
| 1. | අරම ... | හොරේවල දෙයියන්වල පාර (පරදෙම්පිටිය හරහා) | 80 ... | 8 |
| 2. | | අරම දෙයියන්වල පාර ... | 16 ... | 12 |
| 3. | | අරම පුංචිනාරන්ගොල්ල පාර... | 61 ... | 6 |
| 4. | ... | අරම උඩගම්මැද්ද පාර ... | 18 ... | 6 |
| 5. | | දෙයියන්වල පාසල අසලින් පටන් ගෙන හොරේවල පෝඩාපේ පාරට වැටෙන පාර | 7 ... | 6 |
| 6. | | අරම රහල බටහිර පාර ... | 24 ... | 18 |
| 7. | | දෙයියන්වල හොරේවල පාර (ගල්කුඹුර හරහා) | 57 ... | 8 |
| 8. | සැලව ... | අරම රහල බටහිර පාර ... | 37 ... | 24 |
| 9. | | බුවැලිකඩ කළල්පිටිය පාර ... | 49 ... | 16 |
| 10. | | රහල ගැටකොහැල්ල අමුණපාර | 131 ... | 6 |
| 11. | | සැලව ගැටකොහැල්ල පාර ... | 73 ... | 6 |
| 12. | | රහල වදගම්මන පාර ... | 57 ... | 6 |
| 13. | | කළල්පිටිය දෙළොස්බාගේ පාර | 159 ... | 16 |
| 14. | | සැලව දුම්බුළුවාව පාර ... | 27 ... | 8 |
| 15. | | මැදිලිය පරගහපිල්ල පාර ... | 28 ... | 6 |
| 16. | | සැලව මැදිලිය පාර ... | 89 ... | 6 |
| 17. | | රන්දිලිගම හුණුකුඹුර පාර ... | 38 ... | 6 |
| 18. | | මැදිලිය රන්දිලිගම ඇටන්වල පාර | 37 ... | 8 |
| 19. | | හොරේවල හෙම්මාතගම පාරේ ප්‍රසිද්ධ පාරෙන් වෙනස්වූ කොටස | 20 ... | 12 |
| 20. | | රන්දිලිගම කළල්පිටිය පාර ... | 46 ... | 8 |
| 21. | | පතබෙමුලතැන්නේ සිට පල්ලෙ ගම කුඹුර හරා බුවැලිකඩ කළල්පිටිය පාරට වැටෙන පාර | 24 ... | 12 |
| 22. | හකුරුගම්මන ... | හොරේවල කත්තොටුව හරහා බෝපිටිය පාර | 199 ... | 14 |
| 23. | | තෙල්එකේ තල්ගස්පිටිය පාර... | 37 ... | 14 |
| 24. | | හකුරුගම්මන තල්ගස්පිටිය පාර | 65 ... | 14 |
| 25. | | තෙල්එකේ දූල්දෙනිය පාර ... | 33 ... | 14 |
| 26. | | බුළුගල්ලේදෙනිය කහුගොඩ තැන්න පාර | 68 ... | 14 |
| 27. | | හකුරුගම්මන බුත්සරණ කොටුව පාර | 11 ... | 14 |
| 28. | | තෙල්එකේ කිරිංගල පාර ... | 24 ... | 14 |
| 29. | ... | පන්නල්තොට අරණායකමංකඩ පාර | 36 ... | 14 |
| 30. | | මල්වත්තේ සිට ඉබාරළුව පාර | 32 ... | 14 |
| 31. | | පන්නල්තොට අලගල්ල මැදිලිය ඇලවේල්ල පාර | 183 ... | 14 |
| 32. | | කත්තොටුව ගන්ගොඩැල්ලපාර | 33 ... | 6 |
| 33. | | පන්නල වැවල පාර ... | 14 ... | 12 |
| 34. | දූල්දෙනිය ... | දෙමළහීරිය මැදිලිය පාර ... | 147 ... | 14 |
| 35. | | දෙමළහීරිය පන්නල්තොට පාර | 105 ... | 14 |
| 36. | | දූල්දෙනිය කොට්ටල්බැද්ද පාර | 34 ... | 14 |
| 37. | | කීරපනේ දූල්දෙනිය පාර ... | 38 ... | 14 |
| 38. | | දූල්දෙනිය ස්නානය පාර ... | 39 ... | 14 |
| 39. | | තෙල්එකේ දූල්දෙනිය පාර ... | 33 ... | 14 |
| 40. | | දූල්දෙනිය වස්සාදෙනිය පාර ... | 23 ... | 14 |
| 41. | | මදිරඹදෙනිය පන්නල්තොටපාර | 45 ... | 14 |
| 42. | | පන්නල දෙමළහීරිය පාර ... | 71 ... | 14 |
| 43. | අරණායක ... | අරණායක අම්බලකන්ද පාර ... | 70 ... | 14 |
| 44. | | අරණායක මංකඩ අප්පල්ලා ගොඩ පාර | 41 ... | 8 |
| 45. | | අරණායක උග්ගොඩ පාර ... | 6 ... | 8 |
| 46. | | ඇත්කඳඹිට ඔයට බහින පාර | 2 ... | 8 |
| 47. | | අරණායක මංකඩ හකුරුගම්මන ඇලවේල්ල වැවලදෙනියපාර | 39 ... | 14 |
| 48. | | උඩගම පන්සල ළඟ සිට උඩගම ගම්මැන්ඩිය දක්වා පාර ... | 35 ... | 14 |
| 49. | වැලිමන්න ... | වැලිමන්න ගැටබෙරිකන්ද පාර | 133 ... | 12 |
| 50. | | ගල්බොක්ක පාසල ළඟ සිට ගැටබෙරිකන්ද පාසල දක්වා ශ්‍රමදාන පාර | 43 ... | 12 |
| 51. | | හත්ගම්පල එළගිටිය හරහා ගැට බෙරිකන්දපාර(කරගහතැන්න මායිම දක්වා) | 26 ... | 6 |
| 52. | අම්බලකන්ද ... | හොරේවල අම්බලකන්ද දෙල් ගම්මන කුඹුර දක්වා පාර | 122 ... | 8 |
| 53. | | පෝඩාපේ අරම පාර ... | 84 ... | 12 |
| 54. | | වෙලන්තලාව බෙරවිල පාර ... | 14 ... | 8 |
| 55. | | අම්බලකන්ද ගැටබෙරියකන්ද පාර | 29 ... | 6 |
| 56. | | අම්බලකන්ද ගංතුන පාර ... | 35 ... | 12 |
| 57. | තල්ගස්පිටිය ... | තල්ගස්පිටිය තලාව පාර ... | 88 ... | 14 |
| 58. | | ගල්කඩුව පල්ලේවෙල පාර ... | 30 ... | 6 |
| 59. | | දෙමළහීරිය මැදිලිය පාර ... | 40 ... | 14 |
| 60. | | තල්ගස්පිටිය අලගල්ල පාර ... | 11 ... | 14 |
| 61. | | දිවෙල්ගම පෙතිගම්මන පාර ... | 27 ... | 14 |
| 62. | | තල්ගස්පිටිය තලාව පාරේ දෙනියේ සිට කලඹටුවාගල දක්වා පාර | 29 ... | 14 |
| 63. | | තල්ගස්පිටිය පෙතිගම්මන පාර | 21 ... | 14 |
| 64. | | ගල්ගොඩ පනපූරේ පාර ... | 36 ... | 14 |
| 65. | හබලක්කාව ... | දෙමළහීරිය මීපිටිය පාර ... | 144 ... | 14 |
| 66. | | හබලක්කාව මීපිටිය හන්දිය පාර | 65 ... | 14 |
| 67. | | අඹකුඹුර මීපිටිය පාර ... | 30 ... | 14 |
| 68. | | බකුල්වල විහාරස්ථානය පාර... | 25 ... | 14 |
| 69. | | මුදුනෙ කඩේ ළඟ සිට කොට්ට ගහමුල කඩේ ළඟට වැටෙන පාර | 40 ... | 14 |
| 70. | | තල්ගස්පිටිය තලාව පාර ... | 20 ... | 14 |
| 71. | | හෙම්මාතගම දිප්පිටිය පාරේ දෙල්ගහමුල කඩේ ළඟ සිට පල්ලිය හරහා මැදිලිය තලාව පාර | 52 ... | 14 |
| 72. | | බකුල්වල පාසල ළඟ සිට තැබරව පාර | 39 ... | 14 |
| 73. | | තල්ගස්පිටිය ගැරපත්ගම පාර | 64 ... | 14 |
| 74. | විල්පල ... | දිප්පිටිය මෝරාගම්මන පාර ... | 99 ... | 14 |
| 75. | | දිප්පිටිය දිඹුල්ගමුව ගල්බොක්ක පාර | 80 ... | 14 |
| 76. | දිප්පිටිය ... | දිප්පිටිය වේරගොඩ පාර ... | 104 ... | 14 |

| අංකය | කොට්ඨාශය | පාරේ නම | දිග දම්වැල් | | පළල අඩි |
|---|---|---|---|---|---|
| 77. | | ගැරුපත්ගම පැහිනිපැද්දර පොල් අඹේගොඩ පාර | 34 | ... | 14 |
| 78. | | ගැවිලිපිටිය තවලන්ගොඩ පාර | 35 | ... | 14 |
| 79. | | දිප්පිටිය බුදවත්ත පාර ... | 34 | ... | 12 |
| 80. | | දිප්පිටිය සැසිබංගලා පාර ... | 3 | ... | 14 |
| 81. | ගැවිලිපිටිය ... | ගැරුපත්ගම පැහිනිපැද්ද පොල් අඹේගොඩ පාර | 83 | ... | 14 |
| 82. | | ගැවිලිපිටිය පැහිනිපැද්දර පාර... (ගල්දෙනිය බෝක්කුව ළඟ සිට) | 64 | ... | 14 |
| 83. | | ගැවිලිපිටිය තවලන්ගොඩ පාර | 13 | ... | 14 |
| 84. | | ගැවිලිපිටිය පැහිනිපැද්දර ශ්‍රමදාන පාර | 80 | ... | 14 |
| 85. | | වැලිකුඹුර ගැවිලිපිටිය පාර ... | 53 | ... | 14 |
| 86. | | ගැවිලිපිටිය මෝරාගම්මන පාර | 39 | ... | 12 |
| 87. | | නාරන්ගම්මන කුත්තිරිපිටිය පාර | 20 | ... | 14 |
| 88. | | නාරන්ගම්මන බුළුගම්මන පාර (අඹදෙනිය ස්ටෝරුව ළඟ සිට) | 7 | ... | 12 |
| 89. | නිකපිටිය ... | නාරන්ගම්මන බුළුගම්මන පාර | 53 | ... | 12 |
| 90. | | කටුගහවත්ත සිට බුළුගම්මන බුළුවුල කොටුව පාර | 50 | ... | 14 |
| 91. | | උඩගම්මැද්ද නාරන්ගම්මන පාර | 19 | ... | 14 |
| 92. | | කාල්වාන නාරන්ගම්මන පාර... | 62 | ... | 14 |
| 93. | | කාල්වාන ගම්මැද්ද පාර ... | 19 | ... | 14 |
| 94. | | අළුපොත කෝන්ගහකැලේ දක්වා පාර | 25 | ... | 14 |
| 95. | | ගැරුපත්ගම පැහිනිපැද්දර පොල් අඹේගොඩ පාරේ කමත ළඟ සිට මීපිටිය දක්වා පාර | 64 | ... | 14 |
| 96. | | නාරන්ගම්මන කුත්තිරිපිටිය පාර | 50 | ... | 14 |
| 97. | | කාල්වානේ සිට නාරන්ගම්මන දක්වා පාර | 26 | ... | 12 |
| 98. | ගොඩිගමුව ... | පොල්අඹේගොඩ කටුගහ පාර | 89 | ... | 14 |
| 99. | | පොල්අඹේගොඩ කටුගහ පාරේ සිට දික්දෙනිය දවතේ කුඹුර මැදින් කන්දේගම්මැන්ඩිය මැදින් කුත්තිරිපිටිය නාරන් ගම්මන පාරට වැටෙන පාර | 59 | ... | 14 |
| 100. | | අළුපොත කම්මල ළඟ සිට බම්පනේ පාර | 37 | ... | 14 |
| 101. | | පල්මුල්ලේහේනේ පොල්අඹේ ගොඩ පාසල් පාර | 10 | ... | 14 |
| 102. | | පොල්අඹේගොඩ පන්සල ළඟ සිට බෝගහමුල කොටුව දක්වා පාර | 35 | ... | 12 |
| 103. | | ගොඩිගමුවේ සිට කාල්වාන ගම්සභා පාර දක්වා පාර | 40 | ... | 12 |
| 104. | එළගිපිටිය ... | ගල්බොක්ක පාසල ළඟ සිට ගැටබෙරිකන්ද පාසල දක්වා ශ්‍රමදාන පාර | 117 | ... | 14 |
| 105. | | හත්ගම්පොල එළගිපිටිය හරහා ගැටබෙරිකන්ද පාර | 146 | ... | 14 |
| 106. | | එළගිපිටිය එළගිටිය වත්ත පාර | 16 | ... | 6 |
| 107. | | හත්ගම්පල එළගිපිටිය හරහා ගැටබෙරිකන්ද පාරේ අඹ තැන්නේ සිට පන්සල වත්ත දක්වා පාර | 16 | ... | 6 |
| 108. | | මෝරාගම්මන ගැටබෙරිය පාර | 11 | ... | 14 |
| 109. | | පරපිටිය බෙලිගොඩ පාර ... | 53 | ... | 14 |
| 110. | හත්ගම්පල ... | හත්ගම්පල බකලේගල ඉඹුල හේන පාර | 84 | ... | 14 |
| 111. | | තලගොල්ලේහේන පාර ... | 37 | ... | 14 |
| 112. | | කටුපැලැල්ලමුල්ල කපුවත්ත පාර | 30 | ... | 12 |
| 113. | | උඩගමතැන්න කිණගහ හරහා බකලේගල පාර | 80 | ... | 14 |
| 114. | | වෙදා වත්තේ සිට කානම් වත්ත දක්වා පාර | 19 | ... | 14 |
| 115. | | මෝරාගම්මන වැටකොළුහේන පාර | 70 | ... | 14 |
| 116. | | හත්ගම්පල දෙමටාන පාසල දක්වා පාර | 16 | ... | 14 |
| 117. | | පරපිටිය තලගහගෙදර පාර ... | 28 | ... | 14 |
| 118. | | පරපිටිය කොළඹිය පාර ... | 18 | ... | 14 |
| 119. | | මෝරාගම්මන වාගොල්ල හේන පාර | 16 | ... | 14 |
| 120. | දෙබත්ගම (1) උඩබාගේ ... | දෙබත්ගම හරන්කහපොත පාර | 34 | ... | 14 |
| 121. | | දෙබත්ගම ගුණයාකොටුව පාර | 40 | ... | 14 |
| 122. | | හොරතලායවත්ත සිංහල ගෙදර වත්ත පාර | 39 | ... | 14 |
| 123. | | දෙබත්ගම අම්බලම මහවෙල පාර | 39 | ... | 14 |
| 124. | | දෙබත්ගම දම්පැල්ගොඩ පාර ... | 170 | ... | 14 |
| 125. | | දෙබත්ගම කළුගල කොළඹිය පාර | 35 | ... | 12 |
| 126. | | දෙබත්ගම පංගුහේනේ සිට කන් නොරුව කුඹුර ඉවුර උඩ හේන හරහා පාර | 8 | ... | 3 |
| 127. | දෙබත්ගම (ii) පල්ලේබාගේ ... | දෙබත්ගම පල්ලේබාගේ පාර ... | 29 | ... | 6 |
| 128. | | පරපිටිය පල්ලේබාගේ පාර ... | 47 | ... | 6 |
| 129. | | වියන්එළිය අස්මඩල පාර ... | 76 | ... | 14 |
| 130. | | දෙබත්ගම හන්දිය බුළුපිටිය හංදිය පාර | 59 | ... | 14 |
| 131. | | දෙබත්ගම උඩබාගේ පිටකොටුව පාර | 19 | ... | 14 |

8–1049—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1970 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන වාද්දුව සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස්ථානය |
|---|---|
| ඇම්. පී. ඇම්. නව්පීක් ... | වාද්දුව ප්‍රසිද්ධ වෙළඳ පොළෙහි හරක් මස් කඩය. |

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වාද්දුව.

1970 අගෝස්තු මස 15 වෙනි දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

8–1040—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (3) වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කරනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,677 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරණ කාණ්ඩයද, 1966 ජූලි මස 8 වෙනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1969 ජනවාරි මස 3 දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 හා 41 වන කාණ්ඩද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට, කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ගම්සභාව විසින් 261 වන අධිකාරය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ."

ඇස්. ඞී. ඇලඩින්,
දොඩන්ගොඩ ගම්සභාවේ වැඩබලන සභාපති.

1970 ජූලි මස 20 වැනි දින,
දොඩන්ගොඩ ගම්සභා කාර්යාලයේදීය.

8–1041—70.8.28 දින අංක 14,921 දරන ගැසට් පත්‍ර

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී